රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

அரசாங்க நிருவாகச் சுற்றறிக்கை

Public Administration Circular

අංක
இல.
No. } 45

# රජයේ දෙපාර්තමේන්තුවල අතියම් ලිපිකරුවන්

## அரசாங்க திணைக்களங்களில் அமைய எழுதுனர்

## Casual Clerks in Government Departments

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.

මිළ விலை Price : -/10 තැපැල් ගාස්තුව தபாற் செலவு Postage : -/15

මගේ අංකය : 588/1/2/18(එක්ස්)
1972 පෙබරවාරි මස 16 වැනි දින,
කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ,
ඒකාබද්ධ සේවා අංශයේ දීය.

සියළුම ස්ථිර ලේකම්වරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙතටයි.

## රජයේ දෙපාර්තමේන්තුවල අනියම් ලිපිකරුවන්

1. රජයේ දෙපාර්තමේන්තුවල අනියම් ලිපිකරුවන් සම්බන්ධයෙන්, රජය විසින් පහත සඳහන් තීරණයන්ට එළඹී තිබේ :—

(අ) **නිශ්චිත කෙටි කාලීන කාර්යයන් සඳහා** බඳවා ගනු ලැබූ අය හැර පහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන රජයේ දෙපාර්තමේන්තුවල අනෙකුත් අනියම් ලිපිකරුවන් දැනට සේවයේ නියුක්ත වී සිටී නම්, ඔවුන් සේවයේ රඳවා ගත යුතු අතර, 1971 අගෝස්තු මස 1 වැනි දිනට පසු ඔවුන්ගේ සේවය අත්හිටුවනු ලැබුයේ නම් ඔවුන් සේවයට නැවත කැඳවිය යුතුය :—

(i) දැනට සේවයේ නියුතු ලිපිකරුවන්ට, 1971 සැප්තැම්බර් මස 1 වැනි දිනට යටත් පිරිසෙයින් සමසක සම්පූර්ණ සේවා කාලයක් තිබිය යුතු අතර, 1971 අගෝස්තු මස 1 වැනි දිනට පසු සේවය අවසන් කරනු ලැබූ ලිපිකරුවන්ට, ඔවුන්ගේ සේවය අවසන් කරන ලද අවස්ථාව වන විට යටත් පිරිසෙයින් සමසක සම්පූර්ණ සේවා කාලයක් තිබිය යුතුය.

(ii) මෙම ලිපිකරුවන්ගේ වැඩ සහ හැසිරීම අදාළ දෙපාර්තමේන්තුව විසින් සතුටුදායක බැව් සළකනු ලැබිය යුතුය.

කරුණාකර ඉහත සඳහන් තීරණයන්ට අනුව ක්‍රියාකර මෙම චක්‍රලේඛ ලිපියේ විධි විධානයන්ට අනුකූලව සේවය් රඳවා ගනු ලැබූ අනියම් ලිපිකරුවන්ගේ නම්, ලිපිනයන්, වයස, අධ්‍යාපනික සුදුසුකම් සහ පත්වීමේ/යළි සේවයට බඳවා ගැනීමේ දිනයන්, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ වෙත දැනුම් දෙන්න. සේවයේ රඳවාගනු ලැබූ එබඳු අනියම් ලිපිකරුවන්ගේ සංඛ්‍යාව ප්‍රථමයෙන්ම ඕනෑම දෙපාර්තමේන්තුගත ලිපිකරු සේවයක සේවක සංඛ්‍යාවේ පුරප්පාඩුවලට හිලව් කළ යුතු වන අතර, එසේ කළ නොහැකි අවස්ථාවලදී සාමාන්‍ය ලිපිකාර සේවයේ පුරප්පාඩුවලට ද හිලව් කළ යුතු වේ. අනුමත සේවක සංඛ්‍යාව ඇතුළත ඔවුන් සියළු දෙනාටම ඉඩ සැලසිය නොහැකිනම්, වැඩිපුර අය පුරප්පාඩු ඇති දෙපාර්තමේන්තු වලට පත්කර යැවීම සඳහා කටයුතු යෙදීමට හැකිවන පරිදි ඒ පිළිබඳව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ වෙත දන්වනු මැනවි.

2. මින් ඉදිරියට ඒ ඒ රජයේ දෙපාර්තමේන්තු විසින් අනියම් ලිපිකරුවන් කිසිවකු බඳවා නොගත යුතු යයි තීරණය කර ඇත. අනාගතයේදී කිසියම් දෙපාර්තමේන්තුවකට අනියම් ලිපිකරුවන් අවශ්‍ය වන්නේ නම්, ඒ බව රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුව (ඒකාබද්ධ සේවා අංශය) වෙත දැනුම් දිය යුතු අතර, ඒකාබද්ධ සේවා අංශය විසින් පරිගණක තොරතුරු බැංකුව මගින් අවශ්‍ය ලිපිකරුවන් පත්කෙරෙනු ඇත. අවශ්‍ය ලිපිකරුවන් සංඛ්‍යාව සහ ඔවුන් සේවය කළ යුතු දිස්ත්‍රික්කය ද දක්වමින් දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් මේ සඳහා ඒකාබද්ධ සේවා අංශයෙන් ඉල්ලුම් කළ යුතු වේ.

බී. මහාදේව

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ
කටයුතු භාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් සහ වැඩබලන
රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල්.